

තණ්හාවෝ
නතාරි දම්සිනි විතානාච්චි

# තණ්හාවෝ

නතාරි දම්සිනි විතානාච්චි

# තණ්හාවෝ

කතාව, පිටකවරය සහ පරිගණක අක්ෂර
නතාරි දම්සිනි විතානාච්චි

නො. 27/A, ධර්මාශෝක මාවත, මහනුවර

ISBN:
978-624-97141-1-3

එළිදැක්වූ වර්ෂය:
2023

කතෘගේ වෙනත් පොත්,

තෑග්ග
අනූගේ චාරිකාව
අනාගතයට ගමනක්
අමරණීයයකුගේ මරණය සහ තවත් කෙටිකතා
The Gift (පරිවර්තන)
බාර්බි සහ අධිරාජ්‍යයාගේ තේ බඳුනේ අභිරහස (පරිවර්තන)

***...පිදුම...***

සෑමවිටම මා පසුපස සෙවණැල්ලක් මෙන් හිඳිමින්

මා හට යෝධ ශක්තියක් වූ

මගේ ආදරණීය දෙමව්පියන්ටත්,

කුඩා කළ කතන්දර කියාදුන්

මගේ ආදරණීය අත්තම්මාටත්,

මා හට සිප්සතර දුන්

මගේ ගුරුවරුන්ටත්

මේ පොත ආදරයෙන් පුදමි.

## ...පෙරවදන...

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමින් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක

ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.


ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විදුහල, මහනුවර
2023.10.20

# ...ස්තූතිය...

මේ පොත එළිදැක්වීමට මා හට සහය දැක්වූවෝ බොහෝය. පොතක් ලිවීමට මා සිතේ ආශාවක්, උනන්දුවක් සහ ධෛර්යයක් ඇති කළ එම්. එම්. සෙනෙවිරත්න ගුරු පියාණන්ට ප්‍රථමයෙන් මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

දෙවනුව මාගේ විශේෂ ස්තූතිය මෙම කතාව මා හට කියාදුන් මගේම අත්තම්මාට පුද කරමි. ව්‍යාකරණ හැසිරවීම, වාක්‍ය ගැලපීම ආදියේ සිට පොත එළිදැක්වීම දක්වා මහත් කැපවීමකින් කටයුතු කළ මාගේ ආදරණීය අම්මා සහ අප්පච්චී ඇතුළු මගේ පවුලේ සැමටත්, මා හට සිප්සතර දුන් සියලුම ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත්, මා පසුපස සිටිමින් නිරතුරුව මා හට ශක්තියක් වූ සියලු දෙනාටත් මම මගේ හදපිරි ස්තූතිය පිරිනමමි.

# *කතුවරියගෙන් වදනක්*

පොත් කියවීමටත්, ලිවීමටත් දැඩි ලෙස ආශා කරන මාගේ පස්වන පොත වන මෙම ‘තණ්හාවෝ’ කතාන්දරය වර්ෂ 1970 – 1980 දශකයේදී පමණ සිදු වූ සත්‍ය කතාවක් ඇසුරෙන් ලියා ඇත. වංශවත් පරම්පරාවක ළමාතැනී සතු අධික වටිනාකමකින් යුත් මැණික් මුදුවක් මෙම කතාවට පාදක වී ඇත.

තණ්හාවට වහල් වීම නිසා විනාශවන මිනිස් ජීවිත පිළිබඳව බුදු රදුන් වැඩ සිටි සමයේ පටන් වර්තමානය දක්වාම අසා ඇත්තෙමු. දැක ඇත්තෙමු. අත්විඳ ඇත්තෙමු. මෙම කතාවෙන් කියැවෙන්නේද තණ්හාව හේතුවෙන් විනාශ වුණු ජීවිත පිළිබඳවයි.

නතාරි දම්සිනි විතානාච්චි
මහ/ මහාමායා බාලිකා විදුහල

# 1

අවට පරිසරය සැඳෑ කළුවරෙහි ගිල්වමින් මල හිරු බස්නාහිර අහසේ සෙමෙන් බැස යයි. රාස්සිගේ අව්වෙන් නැහැවී ගිය බස්නායක මහ වලව්ව පොල්වත්ත මධ්‍යයේ නැඟී සිටියේ යෝධයකු මෙනි. මෙම තේජවන්ත වලව්ව ඉදිරිපස කොට්ටම්බා, අරලිය, කොස්, පොල්, අඹ, පේර, සේපාලිකා ආදී ගස්වලින්ද රෝස, දහස්පෙතියා, ඇන්තූරියම්, ඩේලියා, කාර්නේෂන් ආදී වූ මල් පැළැටි වලින්ද ගහණ වූ විශාල මිදුලකි. කුඩා ළමුන් දෙදෙනෙක් වලව් වත්තේ එහාමෙහා දුවමින් සිටියහ. දැල්වුණු ඉදිරිපස ලාම්පු වලින් හාත්පස එළිය කරමින් කළු පැහැ මොරිස් මයිනරයක් වලව් වත්තට සේන්දු විය.

“අම්මේ, මෙන්න තාත්තා ආවා!” සෙල්ලම් කරමින් සිටි කුඩා ළමුන් දෙදෙනා කාරය පසුපස දුවමින් කෑගසන්නට විය.

කාරය වත්තේ කොනක වූ කොට්ටම්බා ගස යට නැවැත්වූ චාල්ස් බස්නායක මහතා දරුවන්ද සමඟ වලව්ව දෙසට පැමිණියේය. තමා ගෙනා රසකැවිලි මල්ල සිය දරුවන් අතට දෙමින් ඔහු සිය බිරිඳ, විශාකා ඇමතුවේය.

"විශාකා, මට කොළඹට මාරුවක් ලැබුණා. ඊළඟ මාසේ ඉඳලා මට කොළඹ තමයි වැඩ කරන්න වෙන්නේ."
විශාකා පැමිණ සිය සැමියා අත වූ බෑගය ගනිමින් මෙසේ ඇසුවාය.
"මාරුවක් ලැබෙන්න තව අවුරුද්දක් විතර තියෙනවා නේද?"

"ඔව්, කොළඹ දිසාපතිට හදිසියේම වෙනත් පැත්තකට මාරුවක් හම්බවෙලා. ඒක නිසා තමයි මටත් කලින්ම මාරුව හම්බවුණේ."

"මෙහෙ ඉඳලා කොළඹට හුඟක් දුරයිනේ. කොහොමද යන්නේ එන්නෙ?" බස්නායක මහතා හාන්සි පුටුවට බර දෙන අතරේ විශාකා විමසුවාය.
"මම කල්පනා කළේ නුවරින් ගෙයක් කුලියට ගන්න කියලා. එතකොට ළමයින්ව ඉස්කෝලේ යවන්නත් ලේසියිනේ. මට පුළුවන් සති අන්තයේදී ඇවිත් යන්න."

"මෙච්චර ඉක්මනට ගෙයක් හොයාගන්න පුළුවන් වෙයිද?" විශාකා ගෙට යන්නට හැරෙමින් කීවාය.

"මගේ යාළුවෙක් ඉන්නවා කුලියට දෙන්න තියෙන ගෙවල් ගැන දන්න. මම මිනිහගෙන් අහලා බලන්නම්." කියමින් ඔහු හාන්සි පුටුවේ ඇලවී දෑස් වසාගෙන කල්පනාවකට අවතීර්ණ වූයේය.

…ﾍﾍﾍ ﾍﾍﾍ ﾍﾍﾍ…

බස්නායක මහ වලව්ව මාතලේ දිස්ත්‍රික්කයේ ඉතිරිව පැවති පැරණිතම වලව් කිහිපය අතුරින් එකකි. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ඉදිකරන ලද මෙම වලව්ව ලග්ගල ප්‍රදේශයේ අතිශයින් රමණීය භූමි භාගයක අක්කර අටක පමණ විශාල තේ වත්තක් මධ්‍යයේ පිහිටා තිබුණි.

මෙම වලව්වේ ළමාතැනී හිල්ඩා ගර්ටි මැතිණියයි. ඇය උඩරට වංශවත් කුල පරම්පරාවකින් පැවත එන්නියකි. ඇයට සිය පරම්පරාවෙන් උරුම වූ වටිනාම දෑ අතුරෙහි මෙම බස්නායක වලව්වද වේ. චාල්ස් බස්නායක මහතා ඇගේ එකම පුත්‍රයාද වේ. කාලය ගතවුවද බස්නායක මහ වලව්වේ හෝ එහි ළමාතැනීගේ හෝ තේජසෙහි කිසිදු අඩුවක් සිදු නොවීය. බස්නායක වලව්ව පිටතින් මෙන්ම ඇතුලතින්ද මාළිගාවකට සම විය. වලව්වට පිවිසීමට ඇති විශාල යකඩ ගේට්ටුවෙන් ඇතුළු වන ඕනෑම අයෙකුට තමා ඉදිරියේ දිස්වන දැවැන්ත ගඩොළු නිර්මාණය දුටු විට සිතෙහි සියුම් චකිතයක් ඇති වන්නේ නිරායාසයෙනි.

මෙම වලව්වට ඇතුළු වන ස්ථානයෙහි බ්‍රිතාන්‍ය මහ රැජිනගේ සහ බ්‍රිතාන්‍ය රජ පවුලේ රාමු කළ පින්තූර දොර උළුවස්සට ඉහළින් පෙලට තබා තිබේ. පිලෙහි හාන්සි පුටු දෙකක්ද, තවත් පුටු කිහිපයක්ද

විය. අනර්ඝ බුරුත ලීයෙන් නිමකළ ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වූ විගස ඇතුළු වන ඕනෑම අයෙකුගේ අවධානය මුලින්ම යොමුකර ගැනීමට සමත් වන්නේ කළුවර ලීයෙන් කළ පුටු කට්ටලයටත්, වලව්වේ ළමාතැනීගේ විශාල හාන්සි පුටුවටත් පසෙකින් වූ ඉතා පැරණි කාලයට අයත් බ්‍රිතාන්‍යයෙන් ගෙන්වන ලද ග්‍රැමෆෝනය සහ දුරකථනයයි. වසර සියයකටත් වඩා පැරණි වුවද ඒවා ඉතාම හොඳ තත්වයේ පැවතුණි.

මෙය කාමර හයකින්, විශාල මුළුතැන්ගෙයකින් සහ රමණීය මැද මිදුලකින් සමන්විත විය. මැද මිදුල මධ්‍යයේ කුඩා පොකුණකි. වැසි කලට මෙය ජලයෙන් පිරී ඉතිරී යන්නේ දුටුවන්ගේ සිත් ඇදබැඳ තබාගනිමිනි. තට්ටු දෙකකින් යුත් මෙම වලව්වේ ඉහළ තට්ටුවට නැඟි විට වලව්වට අයත් තේ වත්තත්, ඉන් ඔබ්බෙහි වූ පරිසරයත් අලංකාරව දිස් වේ. ඉහළ තට්ටුවෙහි වූ කුඩා තරප්පු පෙල නැඟි විට සොල්දරයයි. අතීතයේදී එය යම් යම් දෑ ගබඩා කර තැබීමට භාවිතා කළද, පසුව කිසිවකු හෝ එහි ගියේ හෝ නොමැත. දූහුවිල්ලෙන් ගහණ අඳුරු කුටියක් වූ එහි නව අයිතිකරුවන් වූයේ කැරපොත්තන්, මීයන් වැනි සතුන්ය.

මෙම සුවිශාල වලව්වේ වාසය කළේ සුළු පිරිසකි. ඒ වලව්වේ ළමාතැනී ගර්ටි මැතිණියත්, චාල්ස් බස්නායක මහතාත්, විශාකා

බස්නායක මහත්මියත්, ඔවුන්ගේ දරුවන් දෙදෙනා වන සමන්ති සහ ජගත් මෙන්ම වලව්වේ ඉවුම් පිහුම් සඳහා සිටින ඇසිලින් නැමැති තැනැත්තියත්, ඇයගේ අත් උදව්වට සිටින වේළු නැමැති කොලු ගැටයාත්, වත්තේ වැඩකටයුතු බලාකියාගත් සේවකයින් දෙදෙනාත් පමණි. සේවක පිරිස සඳහා වලව්ව පිටුපස කුඩා කාමර කිහිපයක් වෙන්කොට තිබුණි.

කුලභේදය තදින්ම සැලකූ ගර්ටි මැතිණියගෙන් නිසි සැලකුම් ලැබුණේ ඉතා වංශවත් රදල පෙලපත්වල ඇත්තන්ට පමණි. අනෙක් සියල්ලන්ටම ඇය සැලකුවේ ඔවුන්ව ඉතා පහත් මට්ටමක ලාය. එමෙන්ම ඇය සේවකයන්ට වලව්ව ඉදිරිපසට පැමිණීමට හෝ ඉඩ නොදුන්නාය. ගර්ටි මැතිණිය එසේ වුවද බස්නායක මහතා හෝ ඔහුගේ බිරිඳ වන විශාකා කුලභේදය නොසැලකූ අය වූහ. නමුත් වලව්ව පැවතියේ ගර්ටි මැතිණියගේ අණසක යටතේ බැවින් ඔවුහු ඊට විරුද්ධව කිසිවක් නොකියූහ.

## 2

රාත්‍රී ආහාරයට පෙර තම හදිසි ස්ථාන මාරුව පිළිබඳව මවට පැවසීමට සිතාගත් බස්නායක මහතා වේලාසනින් කෑම කාමරයට ගියේය. ඒ වනවිටත් මුළුතැන්ගෙයි රාජකාරී නිසි ආකාරයෙන් සිදුවන්නේ දැයි බලා හමාරකළ ගර්ටි මැතිණිය කෑම කාමරයේ සිය සුපුරුදු අසුනෙහි හිඳසිටියාය. සීලිමේ සිට පහලට කඩා හැළෙන විශාල වීදුරු බල්බ සමූහයේ ආලෝකයෙන් නැහැවුණු කෑම කාමරය මධ්‍යයේ ඇති වටිනා දැවයෙන් නිම කළ අති දැවැන්ත කෑම මේසයේ මුලසුන හිඳ සිටි ඇය පුරාණ රැජිණකගේ ස්වභාවයක් ඉසිලීය. වයස අවුරුදු හැත්තෑපහකට ආසන්න වුවද ඇගේ තේජවන්ත පෙනුම යන්තමින් හෝ අඩුවී නොතිබුණි. සිය පුතු කෑම කාමරයට පැමිණෙනු දුටු ඇ මද සිනහවක් පෑවාය.

බස්නායක මහතා ඇයට පසෙකින් වූ අසුනක හිඳගනිමින් සිය කතාවට අරඇද්දේය. "අම්මේ, මට අම්මට කියන්න කාරණාවක් තියනවා."

"කියන්න." ගර්ටි මැතිණිය සවන් දීමට සැරසෙමින් පැවසුවාය.

"අම්මේ, මට කොළඹ දිසාපති කාර්යාලයට හදිසියේ මාරුවක් ලැබුණා. කොළඹ දිසාපති මහත්තයාට වෙනත් පැත්තකට මාරුවක්

ලැබුණු නිසයි මගෙත් ස්ථාන මාරුව කලින්ම ආවේ.'' ඔහු සිය කතාව නවතා මව දෙස බැලුවේය. ඇය සුපුරුදු තේජවන්ත සහ ඉවසිලිමත් පෙනුමින් යුක්තව අසා සිටින්නීය. සිය මවගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලද හෙයින් ඔහු කතාව ඉදිරියට ගෙනගියේය.

''මට ඊළඟ මාසේ ඉඳලා කොළඹ වැඩකරන්න යන්න වෙනවා. එතකොට මෙහෙ ඉඳලා කොළඹ යන්න අමාරුයි නොවැ. ඒකනිසා මම හිතුවා නුවරින් ගෙදරක් කුලියට අරගෙන අම්මවයි, විශාකාවයි, ළමයි දෙන්නවයි එහේ නවත්තන්න. මට සති අන්තයට ඇවිත් යන්න පුළුවන් නොවැ. නුවර ඉඳලා ළමයින්ට ඉස්කෝලේ යන්නත් ලෙහෙසියිනේ.''

''පුතා, එතකොට මේ වලව්වට මොකද වෙන්නේ?'' ගර්ටි මැතිණිය ශාන්ත එහෙත් තද ස්වරයකින් විමසුවාය.

''මම හිතුවේ වලව්වයි, වත්තයි බලා කියාගන්න කෙනෙක් යොදවන්න.''

''මේ වලව්ව මට බොහොම වටින දෙයක්. මේක දාලා වෙන තැනකට යන්න මට නම් හිත දෙන්නේ නැහැ. මගේ පප්පා, අත්තා, මුත්තා මේ ඔක්කොම මේ වලව්වෙමයි උපන්නේ. මේ වලව්වෙමයි මියැදුණේ.'' ගර්ටි මැතිණිය තද ස්වරයකින් කියාගෙන ගොස් මඳකට නවතා

කල්පනාවක යෙදුණාය. මඳ වේලාවකට පසු ඇය නැවතත් සිය කටහඬ අවදි කළාය.

"පැටව් දෙන්නගේ ඉගෙනීම් කටයුතු ගැන හිතලා මම තීරණයක් ගන්නම්. මට වලව්ව බලා කියාගන්න ගෙන්වන මිනිස්සුන්ව හම්බවෙන්න ඕන. කවුද වලව්ව බලාගන්ට සුදුසු කියලා මම තීරණය කරන්නම්."

ගර්ට් මැතිණිය කුලී නිවසක පදිංචිවීමට අකමැත්ත ප්‍රකාශ කරාවියැයි සිතුවද බස්නායක මහතා තමා සිතුවාටත් වඩා පහසුවෙන් සාකච්ඡාව අවසන් වීම ගැන සිත යටින් සතුටු වූවේය. නුමුත් ඊළඟට ඇත්තේ භාරදූර කාර්යයකි. එනම්, කුලියට නිවසක් සොයා ගැනීම සහ වලව්ව බලාකියා ගැනීමට සුදුසු කිහිපදෙනෙකු සොයාගැනීමයි. මෙසේ සිතමින් සිටි බස්නායක මහතා නැවතත් පියවි සිහියට පැමිණියේ සිය මව අසණු ලැබූ පැනයකිනි.

"පුතා කොච්චර කාලයක් කොළඹ වැඩ කරනවද?"

"මහ කාලයක් නෙවෙයි අම්මේ, එක අවුරුද්දයි." ඔහු එසේ පවසා නිමවත්ම විශාකා සහ දරුවන් දෙදෙනා කෑම කාමරයට පැමිණියහ. ඉන් විනාඩි කිහිපයකට පසු වලව්වේ මෙහෙකාරිය වන ඇසිලින් සහ

ඇගේ අත්උදව්වට සිටින වේළු නැමැති කොලුගැටයාත් පැමිණ රාත්‍රී ආහාරය මේසය මත තැබූහ. කෑම මේසයේදී කතාබහ කිරීම බස්නායක වලව්වේ තහනම් ක්‍රියාවක් වූයෙන් බස්නායක මහතා තවදුරටත් සිය ස්ථාන මාරුව පිළිබඳව කිසිවක් නොදෙඩීමට වගබලාගත්තේය.

# 3

පසුදින සේවය නිමවූ පසු බස්නායක මහතා සිය මිතුරකු වන ජයතිලක මුණගැසීමට සිතුවේය. දිසාපති කාර්යාලයට වීදි කිහිපයක් එහා පාළුවට ගිය පටුමඟක ජයතිලකගේ නිවස විය. පටුමඟ කෙළවර වන ස්ථානය තෙක් රිය පදවාගෙන ගිය ඔහු ජයතිලකගේ නිවස ඉදිරිපස මාර්ගයේ අයිනක කාරය නවත්වා නිවස දෙසට ගියේය. එය ගඩොලින් නිර්මිත එක් මහලකින් යුත් කුඩා නිවසකි. වහලයේ සෙවිලි කර තිබුණේ බාල වර්ගයේ උළු විශේෂයකිනි.

ඔහු නිවසේ දොරට තට්ටු කර බලා සිටියේය. මද වේලාවකින් දොර ඇරුණි. දොර අසලින් බස්නායක මහතා ඉදිරියට පැමිණියේ අඩි හයක් පමණ උස් තට්ට හිසක් සහිත මිනිසෙකි. ඔහු බස්නායක මහතාගේ මිතුරා වන ජයතිලකය.

“බස්නායක.... හුඟ කාලෙකින් නෙවැ! මොකද මේ හදිසියෙම මේ පැත්තේ එන්න හිතුණේ? එන්ට, එන්ට ඇතුලට.” ඔහු සිනහමුසු මුහුණින් බස්නායක මහතාව පිළිගනිමින් පැවසුවේය.

“නැහැ, මෙහෙම හොඳයි ජයතිලක. මට ජයතිලක ගෙන් පොඩි උදව්වක් ඕන.”

“පුළුවන් දෙයක්නම් කොරලා දෙන්නම්.”

“මේ.. නුවර පැත්තේ කුලියට දෙන්න ගෙවල් තියනවද? අවුරුද්දකට විතර ගන්න?”

“කාටද?”

“මට, මට කොළඹට මාරුවක් ලැබුණා. ඊළඟ සතිය වෙද්දිවත් හොයාගන්න ඕන.”

“නුවර කුලියට දෙන්න තියෙන හොඳ ගෙවල් නම් කීපයක්ම තියනවා. මම හොයලා දෙන්නම්.”

“කවදාට විතරද මට ඒ ගෙදර ගැන තොරතුරු දෙන්න පුළුවන්?”

“මම හෙට දිසාපති කාර්යාලයට ගෙනත් දෙන්නම්, උදෙන්ම.”

“බොහොම ස්තූතියි, ජයතිලක. එහෙනම් මම ගිහින් එන්නම්.” කියමින් ගේට්ටුවෙන් පිටතට පැමිණි කාරයට නැඟුණු බස්නායක මහතා වලව්ව වෙතට සිය මොර්ස් මයිනරය පදවාගෙන ගියේය.

…..…

පසුදින උදෑසන බස්නායක මහතා සිය කාර්යාලයට පැමිණෙන විටත් ඔහුගේ මිත්‍රයා වන ජයතිලක එහි පැමිණ සිටියේය.

"සුභ උදෑසනක්! ජයතිලක උදෙන්ම ඇවිත්." බස්නායක මහතා කාරයෙන් බසිමින් පැවසුවේය.

"ඔව්, මට අද තව වැඩකට යන්න තියෙන නිසා උදෙන්ම ආවා."

"එන්න, ඇතුලට." කියමින් ඔහු ජයතිලක සමඟ කාර්යාලය තුලට යාමට සැරසුණද ජයතිලක ඔහු වැලකුවේය.

"ඕන නැහැ, මට පරක්කු වෙනවා. ඒකනිසා මේ විස්තර ටික දීලා යන්නම්."

"හරි,හොඳයි එහෙනම් තොරතුරු ටික දෙන්නකෝ."

"මට හම්බවුණා නුවර කුලියට දෙන්න තියෙන ගෙයක්. ඒ ගෙදර හොඳ පවුලකට අයිති එකක්. තියෙන්නේ ලේවැල්ලේ, මහවැලි ගඟ ළඟම. ටිකක් ලොකු ගෙයක්."

“ඒක අයිති කාටද?”

“මහනුවර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කෘෂි උපදේශකට. නම චන්ද්‍රරත්න.”

“මට ඒ මහත්තයාගේ දුරකථන අංකයක් දෙනවාද?”

“ආ... මෙන්න.” කියමින් ජයතිලක හතරට නැමූ කුඩා කොළ කැබැල්ලක් බස්නායක මහතා අතට දුන්නේය.

“මේක ඒ මහත්තයාගේ ගෙදර දුරකථන අංකයද?”

“ඔව්, දැන්නම් චන්ද්‍රරත්න මහත්තයා ඇත්තේ රාජකාරී ස්ථානයේ, මයෙ හිතේ. දැන් කතාකරන්න ඕනනම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට තමයි කතාකරන්න වෙන්නේ.”

“බොහොම ස්තූතියි ජයතිලක මේ කරපු උදව්වට.”

“මට පරක්කුවෙනවා. එහෙනම් මම ගිහින් එන්නම්.”

ජයතිලක පිටව ගිය පසු බස්නායක මහතා කාර්යාලයට පැමිණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල අංකයට දුරකථන ඇමතුමක් ලබාගත්තේය.

“මේ කතාකරන්නේ මහනුවර දිසාපති කාර්යාලයෙන්. මට චන්ද්‍රරත්න මහත්තයාට කතාකරන්න පුළුවන්ද?”
මඳ වේලාවකින් දුරකථනයේ අනෙක් පසින් ගොරෝසු කටහඬක් ඇසුණි.

“ඔව් කියන්න, කවුද කතාකරන්නේ?”

“මේ චන්ද්‍රරත්න මහත්මයාද?”

“ඔව්, ඔය කවුද කතාකරන්නේ?”

“මම මහනුවර දිසාපති බස්නායක, චාල්ස් බස්නායක. මට ආරංචියක් ලැබුණා ඔය මහත්තයාගේ ගෙදර කුලියට දෙන්න තියෙනවා කියලා.”

දුරකථනය අනෙක් පසින් තමා අමතනුයේ මහනුවර දිසාපතියැයි කන වැකුණු සැනින් චන්ද්‍රරත්න මහතාගේ කටහඬ වෙනස් වූයේ තමාට කුමන ආකාරයේ හෙණ ගෙඩියක් පහත් වේදැයි සිතුණු බැවිනි.

“ඔව්, ඔව් මහත්තයෝ, මගේ ගෙදර කුලියට දෙන්න තියනවා.” ඔහු සිය හඬ බාල කර බයාදු ස්වරයකින් පිළිතුරු දුන්නේය.

“මම මේ කුලියට දෙන්න තියෙන ගෙයක් හොයනවා. මට චන්ද්‍රරත්න මහත්තයා හමුවෙලා ටිකක් කතා කරන්න ඕන. ඔය මහත්තයාට අද වෙලාවක් පිළියෙල කරගන්න පුළුවන් වෙයිද?”

“මට අද දවල් දොළහෙන් පස්සේ වෙලාවක් දාගන්න පුළුවනි, මහත්තයෝ.”
“හරි, එහෙනම් මම හරියටම දවල් දෙක වෙද්දී ඔහාට එන්නම්කෝ.”

“හොඳයි, හොඳයි, දිසාපති මහත්තයෝ.” කියා චන්ද්‍රරත්න මහතා දුරකථනය තැබුවේ මෙය තමාගේ හොඳ කාලයක්ද, එසේත් නැතිනම් රාහු කාලයක ආරම්භයක්දැයි සිතමිනි.

# 4

පැවසුවාක් මෙන්ම බස්නායක මහතා දහවල් දෙක වදින්නටත් ප්‍රථම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ගියේය. ඔහු එහි ළඟා වන විටත් මිටි තරබාරු සිරුරකින් යුත් චන්ද්‍රරත්න මහතා ගේට්ටුව අසළට වී බලා සිටියේය.

බස්නායක මහතා සිය මොරිස් මයිනරය දෙපාර්තමේන්තුව ඉදිරිපස නවතා ඉන් පිටතට පැමිණියේය.

මේ පැමිණෙන තැනැත්තා දිසාපති වියයුතු යැයි චන්ද්‍රරත්න මහතා සිතුවේය.

“මේ මහත්තයා, නුවර දිසාපති මහත්තයාද?”

“ඔව්, එහෙනම් චන්ද්‍රරත්න කියන්නේ මේ මහත්තයාට වෙන්න ඇති.”

“ඔව්, මම චන්ද්‍රරත්න. එන්න ඇතුලට ගිහින් කතා කරමු.” බරාඳයට ගොඩ වී කෙටි දුරක් ගමන් කළ ඔවුහු කුඩා කාර්යාල කාමරයක් තුලට පිවිසුණහ. කුඩා වුවත් එය තුල තිබුණු බඩුමුට්ටු කිහිපය ඉතා පිලිවෙලට අසුරා තිබුණි.

“එන්න, ඉඳගන්න.” චන්ද්‍රරත්න මහතා අසුනක් පිරිනමමින් පැවසුවේය.

“චන්ද්‍රරත්න මහත්තයාගේ ගෙදර කුලියට දෙන්න හිතාගෙන ඉන්නේ කීයකට විතරද?” බස්නායක මහතා සෘජුවම කාරණයට අවතීර්ණ වෙමින් විමසුවේය.

“මාසයකට රුපියල් හත්සියපනහකට විතර.”

“රුපියල් හත්සියපනහකට? හ්ම්... එතකොට කොච්චර කාලෙකටද ගේ දෙන්නේ?”
“අවුරුදු දෙක තුනකට වුණත්, ගැණුම්කාරයෝ ඉල්ලන කාලයකට.” ඔහු මඳකට නවතා නැවතත් හඬ අවදි කළේය. “මහත්තයට කුලියට ගන්නද?”

“ඔව්, මට අවුරුද්දකට ඔය මහත්තයාගේ ගෙදර කුලියට ගන්න ඕන. ලේවැල්ලේ කිව්වා නේද?”

“ඔව්, ගඟ පේන මානයේ.”

“චන්ද්‍රරත්න මහත්තයාට කරදරයක් නැත්නම් මට අද ගෙදර බලන්න පුළුවන්ද? නැත්නම් වෙන දවසකට....” බස්නායක මහතා එසේ පවසා අවසන් වීමටත් පෙර චන්ද්‍රරත්න මහතා ඊට පිලිතුරු දුන්නේය.

“ආ... ඒකට කමක් නැහැ. දිසාපති මහත්තයා අද ඇවිත් ගේ බලන්නකෝ. මහත්තයා දැන්ම යන්නද නැත්නම් තව හවස් වෙලා යන්නද?”

“දැන්ම ගියොත් නම් හොඳයි. නැත්තම් මාතලේට යද්දී තවත් වෙලා යයි. චන්ද්‍රරත්න මහත්තයාට කරදරයක් නැතිද?”

“නැහැ, නැහැ, එහෙනම් යමු.”
ඔවුහු බස්නායක මහතාගේ මොරිස් මයිනරයේ නැඟී ලේවැල්ල බලා පිටත් වූහ. ඔවුන්ට පැයකටත් අඩු කාලයකින් කුලී නිවසට ලඟා වීමට හැකි වූයේ මහනුවර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිට ලේවැල්ලට එතරම් දුරක් නොතිබුණු නිසාය.

එය නවීන පන්නයට ඉදිකරන ලද අලංකාර දෙමහල් නිවසක් විය. බස්නායක වලව්ව තරම් විශාල නොවුණද, සැපපහසුව විසිය හැකි තරමේ විශාල නිවසක් වූ එය කාමර හතරකින් සහ මුළුතැන්ගෙයකින් සමන්විත විය. මැද මිදුලක් නොතිබුණද මෙම නිවස වටා කොස්, අඹ,

රඹුටන්, කාමරංගා, පොල්, පේර වැනි ගස්වලිනුත්, මලින් පිරුණු බාර්බන්ඩේසියා, කාර්නේෂන්, කපුරු, ඩේලියා වැනි පැලවලිනුත් ගහණ වූ අලංකාර මිදුලක් තිබුණු අතර පහලින් ගලා යන මහවැලි ගඟත් ඉන් ඔබ්බෙහි වූ ගම්මානයත් තෙල් සායම් සිතුවමක් මෙන් ඈතට දිස්විය. ගඟෙහි බැස රෙදි සෝදන කාන්තාවන්, දිය කෙළියෙහි යෙදෙන කුඩා ළමුන්, ජලයේ බැස දාහය නිවාගන්නා හරක් පට්ටි මෙන්ම ගං ඉවුර ආසන්නයේ අටවා තිබුණු දිළිඳු පැල්පත් සමූහයා එම මනහර සිතුවමට එක්කළේ අමුතුම අලංකාරයකි. මෙම දර්ශනය පළමු වතාවට නෙත ගැටෙන ඕනෑම අයකු මෙන්ම බස්නායක මහතාද ස්වභාවධර්මයේ මෙම විරල දර්ශනයෙන් කුල්මත් විය.

පහළින් දිස්වන නෙත් ඇදබැඳ ගන්නා දර්ශනය දෙස මොහොතක් බලා සිටි බස්නායක මහතා ඉන් දෑස් ඉවතට ගෙන තමා පසෙකින් වූ චන්ද්‍රරත්න මහතා ඇමතුවේය. “චන්ද්‍රරත්න මහත්තයාට පුළුවන්ද මට තව උදව්වක් කරලා දෙන්න?”

“මොකක්ද?”

“මගේ වලව්ව බලාකියාගන්න කෙනෙක්ව හොයනවා. චන්ද්‍රරත්න මහත්තයා දන්න කවුරුහරි ඉන්නවාද ඒ වැඩේට හොඳ? විශ්වාසවන්තව වැඩ කරන අය?”

“මම දන්න කියන මිනිහෙක් ඉන්නවා. මිනිහා ඉන්නෙත් මේ ළඟපාතමයි. වයස පනකට කිට්ටු ඇති. මිනිහා තනියම ඉන්නේ. ළමයිනුත් නැහැ. කුලී වැඩක් කරගෙන තමා ජීවත් වෙන්නේ. ඒ වුණාට හොඳ විශ්වාසවන්ත මනුස්සයෙක්. ”

“චන්ද්‍රරත්න මහත්තයාට පුළුවන්ද ඒ මනුස්සයාව දිසාපති කාර්යාලයට එවන්න. මම ඒ මිනිහාත් එක්ක කතාකරලා බලන්න ඕන.”

“මම කියන්නම් මිනිහාට හෙට උදෙන්ම දිසාපති කාර්යාලයට යන්න කියලා.”

“බොහොම ස්තූතියි.”

“එතකොට දිසාපති මහත්තයා පවුලේ අයවත් එක්කරගෙන ආයෙත් මෙහෙ එනවද? ගේ බලන්න?”

“නැහැ, ආයෙමත් මාතලේ ගිහින් එන්න කාලයක් නැහැ. ගෙදර නම් බොහොම හොඳයි. අපිට ලබන විසි වෙනිදා ඉඳලා මේ ගෙදර පදිංචියට එන්න පුළුවන් වෙයිද?”

“විසිවෙනිදාට? ඒ කියන්නේ ලබන සුමානේ බදාදා? හරි එතකොට කී දෙනෙක් විතර පදිංචියට එනවද මහත්තයෝ?”

“මගේ අම්මයි, බිරිඳයි, දරුවෝ දෙන්නයි, ගෙදර වැඩට ඉන්න සේවකයෝ දෙන්නෙකුයි විතරයි.”

“හරි මහත්තයෝ, එහෙනම් මම ගෙදර ලෑහැස්ති කරලා තියන්නම්. මහත්තයලා විසිවෙනිදාට එන්න.”
“හරි එහෙනම් මම ගිහින් එන්නම්, චන්ද්‍රරත්න මහත්තයා.” කියමින් බස්නායක මහතා සිය මොරිස් මයිනරයට නැඟී බස්නායක වලව්වට යාම සඳහා පිටත් විය.

## 5

පසුදින උදෑසන බස්නායක මහතා කාර්යාලයට පැමිණෙනවාත් සමගම මැදිවියේ මිනිසෙක් විත් මුරකරුගෙන් බස්නායක මහතාව හමුවිය හැකිදැයි විමසමින් සිටියේය. ඔහු පිරිසිදු සරමක් හා බැනියමක් ඇද සිටි ඒ තරම් උසක් නොමැති හීන්දැරි පුද්ගලයෙක් විය.

"දිසාපති මහත්තයෝ, මහත්තයාව මුණගැහෙන්න කවුදෝ මනුස්සයෙක් ඇවිත් ඉන්නවා." මුරකරු කීවේය.

"මගේ කාර්යාල කාමරේට එන්න කියන්න."

සුලු මොහොතකින් ඒ මිනිසා බයාදු ලෙස දිසාපතිගේ කාමරයේ දොර අසලට ආවේය.

"එන්න ඇතුලට." ඔහුව දුටු බස්නායක මහතා කීවේය.

"මේ, චන්ද්‍රරත්න මහත්තයා එවපු කෙනා වෙන්න ඇති."

"එහෙමයි, එහෙමයි මහත්තයෝ." ඔහු බොහොම බයාදු ලෙස කීවේය.

"මොකක්ද උඹේ නම?"

"මම සිමා, මහත්තයෝ."

"හොදයි, උඹට ගෙයක් බලාකියාගෙන පලපුරුද්දක් එහෙම තියෙනවාද?"

"අපොයි ඔව්, මහත්තයෝ. මම තරුණ කාලේ අවුරුදු දහදොලහක්ම එක ගෙයක් බලාකියා ගත්තා. කුණ්ඩසාලේ..."

"මගේ මාතලේ තියෙන වලව්ව අවුරුද්දකට බලාකියාගන්න කෙනෙක් හොයනවා. ඒකටයි උඹට කතාකලේ. මම ලිපිනේ දෙන්නම්. උඹ හෙට උදෙන්ම වලව්වට වරෙං."

"හොදමයි මහත්තයෝ."

"එහෙනම්, උඹ දැන් පලයන්. හෙට වලව්වට වරෙන්."

"හොදමයි මහත්තයෝ." ඔහු බස්නායක මහතාට දොහොත් මුදුන් එක්කර වැද යන්න ගියේය.

චන්ද්‍රරත්න මහතාගේ නිවසත්, සිමා පිලිබදවත් සිය මවගේ ප්‍රතිචාරය කෙසේ වේදැයි බස්නායක මහතා සවස සිය නිවසට යන අතරමගදීත් කල්පනා කළේය.

එදින රාත්‍රි ආහාරයට පෙර බස්නායක මහතා තමා කුලියට ගැනීමට සූදානම් කළ නිවස පිළිබඳව සිය මවටත්, බිරිඳටත් පැවසුවේය.

“ඒ ගෙදර තියෙන්නේ හරිම අපූරු තැනක නොවැ. මහවැලි ගඟත්, ඒ ළඟ තියෙන ගෙවල් එහෙමත් ලස්සනට පේනවා.” ඔහු කුලී නිවස වර්ණනා කළේය.

“කීයකටද ගෙදර ගත්තා කියුවේ?” ගර්ටි මැතිණිය විමසුවාය.

“මාසයකට රුපියල් හත්සියපනහකට.”

“හ්ම්, එතකොට කවදා ඉඳලද ගෙදර දෙන්න පුළුවන් කියුවේ?”

“මම ගෙදර ඉල්ලුවේ ලබන විසිවෙනිදා ඉඳලා.”

“ගෙදර අයිතිකාරයාගේ රස්සාව? ඒ මිනිස්සු හොඳ පවුලකින් එන අයද?”

සිය මවගේ මෙම කුලමල භේදය නොරිස්සූ බස්නායක මහතා ඇතිවූ කෝපය මැඩගනිමින් අපහසුවෙන් පිළිතුරු දුන්නේය. “මොන පවුලෙන් පැවත එනවද කියන්න නම් දන්නේ නැහැ අම්මේ, ඒත් චන්ද්‍රරත්න මහත්තයා නම් හොඳ වැදගත් විදියට ඉන්න මහත්තයෙක්. වැඩ කරන්නේ නුවර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන කෘෂි උපදේශක විදියට.”

“මම එදත් පුතාට කියුවානේ ඒ මිනිස්සුන්ගේ සමාජ තත්වේ පොඩ්ඩක් හොයලා බලන්න කියලා. නැත්තම් අඩු කුලේක උන්ගෙන් ගෙවල් ගත්තොත්, ඒක අපේ මුළු පරම්පරාවටම මහා නවනිංගිරාවක් වෙයි.”

“ඉතින් ඒ කියලා අම්මේ, මම කොහොමද ඒ මනුස්සයාගෙන් එයාගේ පරම්පරාව ගැන අහන්නේ? එතකොට ඒ මිනිස්සු මොනවා නොහිතයිද? අනික දැන් කාලේ කවුද හැමදේටම කුලමල බලන්නේ?”

“පුතේ, අපි බස්නායක පරම්පරාවෙන් පැවතගෙන එන වංශවත් උදවිය. අපි වගේ වංශවත් ඇත්තෝ අඩු කුලේ උන්ට බාල්දු වෙන්න ගියාම ඒක අපේ පරම්පරාවට හොඳ නැහැ. බස්නායක පරම්පරාව රැකගෙන ආව හැමෝම අපිට ශාප කරාවි, ඒ විදියට අපි පරම්පරාවට කැළලක් ඇති කළොත්. මිනිස්සු මොනව නොකියයිද අපි අඩු කුලේ උන්ට අතපාන්න ගියාම?”

තවදුරටත් මේ පිළිබඳව කතා කිරීමෙන් කිසිදු පලක් නොවන බව වටහා ගත් බස්නායක මහතා කිසිත් නොකියා එතැනින් පිටව ගියේය.

# 6

පසුදින උදැසනම සිමා වලව්වට පැමිණියේය. වලව්වේ තේජාන්විත බව දැක තරමක් කලබලයට පත් වුණු ඔහු වලව්වේ පිටුපස දොර දෙසට ගියේය. එහි සිටි ඇසිලින්ගෙන් ඔහු මෙසේ ඇසීය.
"අපේ දිසාපති මහත්තයාගේ වලව්ව නේද මේ? මට එන්න කියුවේ දිසාපති මහත්තයා."

"කවුද ඔහේ?" මේ නාඳුනන පුද්ගලයා දුටු ඇසිලින් ඇසුවාය.

"මම සිමා. දිසාපති මහත්තයා මට ඊයේ කියුවා වලව්වට එන්න කියලා."

ඔහුට මදක් ඉන්නයැයි කියූ ඇසිලින් වලව්ව තුලට ගොස් බස්නායක මහතා සොයා ගියාය.
"මහත්තයෝ, අපේ මහත්තයාව මුණගැහෙන්න ඕනය කියලා කව්දෝ මනුස්සයෙක් ඇවිත් ඉන්නවා. අපේ මහත්තයා ඒ මනුස්සයාට එන්න කියුවලු කියනවා." ඇ කීවාය.

"කෑම කාමරයට එන්න කියන්න." කියමින් ඔහු පහල මාලයට යාමට තරප්පුව බැස්සේය.

ඒ අණින් සිමා වලව්ව තුලට යායුතු වුණත්, වලව්වේ පෞරාණික ස්වරූපය ඔහුගේ සිතේ චකිතයක් ඇති කළේය.
"ඉක්මනට යනවා. මහත්තයා කෑම කාමරේට එන්න කියුවා. අර පේන්නේ කෑම කාමරය." ඇසිලින් මුලුතැන්ගෙයට යාබදව පැවති විශාල කාමරය පෙන්වමින් කීවාය.

සිමා සෙමින් ඒ දෙසට ගියේය.
ඔහු එතැනට යන විට බස්නායක මහතාත්, ගර්ටි මැතිණියත් එහි විය. ඔහු බයාදු ලෙස එහි දොරකඩ අසලට වී සිටියේය.

"අම්මේ, මේ සිමා. වලව්ව බලාකියා ගන්න හොයාගත්ත මිනිහා." බස්නායක මහතා කීවේය.

"උඹ වරෙන් මෙහාට." ගර්ටි මැතිණිය දැඩි හඬකින් කීවාය.
සිමා යටහත් පහත් ලෙස කෑම කාමරය තුලට ආවේය.
"මොකක්ද උඹෙ නම කියුවෙ?"

"වලව්වේ හාන්දුරුවනේ, මගේ නම සිමා."

"උඹෙ ගම?"

"ගුන්නැපාන, හාන්දුරුවනේ."
"මීට කලින් වැඩ කරලා පලපුරුද්දක් තියෙනවාද උඹට?"

"එහෙමයි, හාන්දුරුවනේ. මම කුණ්ඩසාලේ ගෙයක් බලාකියාගත්තා අවුරුදු ගණනාවක්ම."
"උඹ දැන් ඉන්නෙත් ගුණ්ණෑපානේම ද?"

"නෑ, හාන්දුරුවනේ. මම දැන් ඉන්නේ ලේවැල්ල කිට්ටුව."

"ගෑනි, ළමයි එහෙම?"

"කවුරුත් නෑ හාන්දුරුවනේ. මම විතරයි."

"මේක බස්නායක පරම්පරවේ මහ වලව්ව. මගේ අත්තා, මුත්තා සේරම ඉපදුනෙත් මේ වලව්වේමයි, මියැදුනෙත් මේ වලව්වේමයි. උඹ මේ වලව්ව බලාකියාගන්න ආරස්සා කරන්න ආවා වගේ නෙවෙයි, මෙහෙ තියෙන බඩු භාණ්ඩ හොරාගත්තොත් අපේ පරම්පරවේ

මියැදුනු උන්නාන්සෙලාගෙන් උඹට විසුමක් වෙන්නේ නැහැ. තමන්ගේ පණටත් වැඩිය මේ වලව්ව ආරස්සා කරන එක තමුන්ගේ යුතුකම..."

"එහෙමයි හාන්දුරුවනේ, එහෙමයි."

තම මවගේ ප්‍රශ්න කිරීම් අවසන් බව වටහා ගත් බස්නායක මහතා සිමා ඇමතුවේය.

"ලබන සුමානේ බදාදා අපි වලව්වෙන් පිටත් වෙනවා. ඊට කලින් දවසක ඇවිත් වලව්වේ නවතින්න. වැඩට ඉන්න කොල්ලා උඹෙ කාමරේ පෙන්නාවි. වත්ත බලාකියාගන්න මිනිස්සු දෙන්නෙකුත් ඉන්නවා. ඒ මිනිස්සුත් එක්ක එකතුවෙලා වැඩකටයුතු කරගෙන යන්න."

"එහෙමයි මහත්තයෝ."

"දැන් සිමාට යන්න පුලුවන්."

"හොඳමයි මහත්තයෝ. මම ගිහින් එන්නම්." ඔහු බස්නායක මහතාටත්, ගර්ටි මැතිණියටත් දෙකට නැවී වැඳවැටී පිටව ගියේය.

"මිනිහාගේ කුලේ නම් ඒතරම් හොද නැහැ. ඒවායේ මිනිස්සු විශ්වාසවන්තව වැඩ කරාවි කියලා මට නම් හිතෙන්නේ නැහැ." ගර්ටි මැතිණිය කීවාය.

"ඒත් අම්මේ, මේ හදිසියට වැඩට ගන්න මිනිස්සු කොහෙන් හොයන්නද?"

ඊට සිය මව කිසිවක් නොකියූ නිසා ඔහු කාර්යාලයට යාමට සූදානම් වූවේය.

# 7

නව නිවසේ පදිංචියට සියල්ලෝම ලහිලහියේ ලැහැස්ති වුවද ගර්ටි මැතිණිය පමණක් තරමක් දුක්බර ලීලාවෙන් පසුවූවාය. කුලී නිවසේ පදිංචියට යාමට පෙර දින ඇය සිය පුත්‍රයා ඇමතුවාය. එවේලෙහි මුළුතැන්ගෙයි අත්උදව්කාර කොළුවා වන චේළු එතැන පසුකරමින් මුළුතැන්ගෙය දෙසට යමින් සිටියේය. ඊළඟ මිනිත්තු කිහිපය තමාගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් කරාවියැයි චේළු සිහිනෙකුදු නොසිතුවේය. ඒ ඔහු ඔහුගේ මෙම වලව්වේ අත් උදව්කරු ලෙස ගෙවන ජීවිතයෙන් සෑහීමකට පත්වී සිටි නිසාය.

"පුතේ, මේ වලව්වේ මට දාලා යන්න බැරි දේවලුත් තියනවා. පුතාට හොඳටම විශ්වාසද අර වලව්ව බලාගන්න ගෙන්නන එකාව?" ගර්ටි මැතිණිය දුක්බරව පැවසුවාය.

"මම හිතනවා ඒ මිනිහා හොඳට වලව්ව බලා ගනීවි කියලා. මිනිහගේ කටහඬින්, පෙනුමෙන් නම් හොරබොරු කරන පාටක් පේන්නේ නැහැ. අම්මා ඔය දාලා යන්න බැරි දේවල් කියලා කියුවේ අර මැණික් මුද්දටද?"

"ඔව්, ඒක බොහොම වටින එකක්."

“ඔව්, ඒකනම් එහෙම තමයි.” ඔහු තත්පර කිහිපයක් කල්පනාකර නැවත හඬ අවදි කළේය. “ඉතින් ඒකත් කුලී ගෙදරට ගෙනියමු. එතකොට ඒක අම්මා ළඟ තියෙන නිසා පරිස්සම්නේ.”

“ඒත් පුතාත් ගෙදර එන්නේ සති අන්තෙදිනේ?”

“ඕක කවුරුවත් හොරකම් කරන්නේ නැහැනේ අම්මේ, කවුරුවත් දන්නේ නැහැනේ ඔයතරම් වටින මුද්දක් අම්මා ගාව තියෙන විත්තියක්?”

වටිනා මැණික් මුදුවක් ගැන රහසේ සිදුවන කතාබහක් ඇසී චේළු ගර්ටි මැතිණියගේ කාමරය අසළ නැවතී රහසේම ඊට කන්දුන්නේය. ඔතරම් වටිනා මැණික් මුදුව දැක ගැනීමේ ආශාවෙන් ඔහු දොර හිලට ඇස තබා බැලුවේය.

කිසිවකු හෝ රහසේම මුදුව දෙස බලා සිටින වගක් නොදත් ගර්ටි මැතිණිය අල්මාරිය තුල වූ කුඩා යකඩ සේප්පුවක් ඇර රත්රන් ආලේපිත කුඩා මංජුසාවක් පිටතට ගත්තාය. චේළු එය තවත් හොඳින් දැකබලා ගැනීම සඳහා දොරෙන් පිටතට වී දෑස් විශාල කර බලාසිටියේය. ගර්ටි මැතිණිය මංජුසාවේ පියන විවෘත කරන විට ඒ මධ්‍යයෙන් මතුවූයේ විශාල මුදුවකි.. ! විශාල මැණික් ගල් නවයක් ඔබ්බවා සැදූ මුදුවකි.. ! කිසිවෙක් කිසිදාක නොදුටු තරම් අලංකාර මුදුවකි... !

අගනා මැණික් ගල් නවයක් රත්රන් ගුලියක ඔබ්බවා සාදා තිබුණු එහි වටිනාකම වේළුට සිතාගත නොහැකි විය. වහලයේ කොනකින් ගලා ආ හිරු කිරණ මුදුවට වැදී ඉන් විහිදුණු දිස්නයෙන් ඔහුගේ දෑස් ගිණිකණ වැටුණි. තම උගුර යටින් අනපේක්ෂිතව විශාල කෑගැසීමක් පිටතට පැනීමට පැමිණියෙන් ඔහු සිය කට අතින් වසාගෙන එතැනින් දිව ගියේය.

මෙම මැණික් මුදුවේ මුල් අයිතිකාරිය ගර්ටි මැතිණියගේ මී මිත්තණියකි. ඇය බ්‍රිතාන්‍ය යටත් විජිත සමයටත් පෙර විසූ බ්‍රිතාන්‍ය සම්භවයක් සහිත වංශවත් කාන්තාවකි. ඇයගෙන් පසු පරම්පරාවෙන් පරම්පරාවට පැමිණි එහි වටිනාකම ඇගේ කාලයේදී රන් පවුම් හාරදහසක් පමණ විය.

මැණික් මුදුව දුටු අවස්ථාවේ සිට එය තමා සතු කරගැනීමේ දැඩි ආශාවක් වේළුගේ සිත තුල තැන්පත් විය. කෙසේ හෝ එය ලබාගැනීමට ඔහු අදිටන් කරගත්තේය. මුදුව සොරකම් කිරීමට ලැබෙන කිසිදු අවස්ථාවක් මඟහැර නොගැනීමට වග බලාගැනීමටද සිතා ගත්තේ මුදුව විකිණීමෙන් පසු තමාට නැවත කිසිදිනෙක කිසිවකුගේ සේවකයකු ලෙස අඟුපිල්වල ලඟින්නට සිදු නොවන බව වැටහුණු හෙයිනි.

# 8

එක්දහස් නවසිය හැත්තෑපහේ නොවැම්බර් මස විසිවෙනි දිනයේ හිමිදිරි උදෑසන ගණඳුර පහව යත්ම සුවිසල් ලොරි රථයක් මහ හඬක් නංවමින් වලව් වත්තට සේන්දු විය. ඒත් සමඟම පැමිණි කිහිප දෙනෙකු ලහි ලහියේම ඔවුන්ට බාරව තිබූ රාජකාරියට සූදානම් වූහ. ඔවුහු උත්සුකව, බස්නායක මහතා විසින් පෙන්වා දෙනු ලැබූ පුටු, මේස ආදී වූ ලීබඩු ලොරියට පැටවූහ. වලව්වේ පිල මත ට්‍රන්ක පෙට්ටි සහ තවත් බඩුබාහිරාදිය සහිත කන්දකි.

සියල්ලෝම ගමනට සූදානම් වන අතර වේළු මැණික් මුදූව ඩැහැගැනීමට අවස්ථාවක් එළැඹෙන තෙක් බලා සිටියේය. නමුත් එවැනි අවස්ථාවක් පෙනෙන තෙක් මානයකවත් නොවීය. බස්නායක මහතා, වේළු ලවා ට්‍රන්ක පෙට්ටි සිය මොරිස් මයිනරයට පැටවූයේය. රැගෙන යන සියලු දෑ පටවා අවසානයේ ඔවුහු ගමනට පිටත් වූහ. ගර්ට්‍රි මැතිණියත්, විශාකාත්, දරු දෙදෙනාත් බස්නායක මහතා සමඟ කාරයෙන් ගමන් කළ අතර වේළු සහ ඇසිලින් ලීබඩු පටවාගෙන කාරය ඉදිරියෙන් ගමන් ගන්නා ලොරියෙහි ගමන් ගත්හ.

මද්දහන වන විට ලේවැල්ලට ළඟා වීමට සමත් වූ ඔවුහු නව කුලී නිවස සොයා ගියහ. ඔවුහු එහි පැමිණෙන විට චන්ද්‍රරත්න මහතා සහ ඔහුගේ බිරිඳ වන ප්‍රේමලතා ගේට්ටුව අසලට වී බලා සිටියෝය.

ලොරිය සහ කාරය නවතා බස්නායක මහතා ගෙට ගොඩ වූයේ අත්උදව්වට පැමිණි පිරිසට ලොරියේ ගෙන ආ දෑ බිමට ගන්නා ලෙසට උපදෙස් දෙමිනි. චන්ද්‍රරත්න මහතා දෑත් එක්කොට 'ආයුබෝවන්' කියමින් පිරිස පිළිගත්තේය. තමා පෙර දින පැමිණෙන විට තිබුණාටත් වඩා පිලිවෙලට හා පිරිසිදුව නිවස තියෙන්නේයැයි බස්නායක මහතාට සිතුණි. නවීන පන්නයට සාදා තිබුණු එම නිවස පිළිබඳව ගර්ටි මැතිණිය එතරම් පැහැදීමකින් පසු නොවූවෙන් ඇයට නව නිවස ප්‍රියමනාප ස්ථානයක් නොවීය. මේ අතර සමන්ති සහ ජගත් අවට පරිසරයේ සුන්දරත්වයෙන් පිනාගිය සිත් ඇතිව වත්ත පුරා දුවමින් සිටියෝය.

නිවෙස තුල බඩුමුට්ටු කිසිවක් නොතිබුණෙන් ඇතුලත හිස්, පාළු ස්වභාවයක් ගෙන තිබුණි. සාලයට පිටුපසින් කාමර දෙකකුත් ඉන් ඔබ්බෙහි මුළුතැන්ගෙයත් විය. මුළුතැන්ගෙය පසෙක ඉහළ මාළය වෙත යාම සඳහා කුඩා ලී තරප්පු පෙළක්ද තිබුණි. අත් උදව්වට පැමිණි පිරිස ළඟි ළඟියේම ලොරියේ පටවාගෙන ආ සියල්ල බිමට බා මිදුලේ පෙළට තබන්නට වූහ.

මේ අතර විශාකාත්, චන්ද්‍රරත්න මහතාගේ බිරිඳ වන ප්‍රේමලතා සහ ඇසිලින් එක්ව සාලය මැද කිරි ඉතිරවීමට සූදානම් කළහ. ඔවුහු සුබ නැකතින් කිරි උතුරවා නිවසටත්, නව පදිංචිකරුවන්ටත් ආශිර්වාද

ලබාගත්හ. අනතුරුව සැවොම කැවුම්, කිරිබතින් සප්පායම් වී බඩු භාණ්ඩ අස්පස් කිරීමෙහි යෙදුණහ.

සියල්ලෝම බඩුබාහිරාදිය අස්පස් කිරීමේ යෙදී සිටියදී ගර්ට් මැතිණිය, චන්ද්‍රරත්න මහතා සහ ඔහුගේ බිරිඳ ප්‍රේමලතා සමඟ තම පරම්පරාවේ වංශවත් බව පිළිබඳව පුරසාරම් දොඩන්නට විය.ඇය සිය පුත්‍රයාට අසා දැන ගැනීමට නොහැකි වූ චන්ද්‍රරත්න මහතාගේ පරම්පරා ඉතිහාසය දැනගැනීමේ අභිලාෂයෙන් පසු විය.

"චන්ද්‍රරත්නලාගේ පරම්පරාව රස්සාව මොකද්ද? ඇය චන්ද්‍රරත්න මහතාව හැල්ලුවට ලක්කරන ස්වරයෙන් විමසුවාය.

"අපේ පරම්පරාවේ රස්සාව නම් වඩුවැඩ. ඒත් නෝනා අපේ පරම්පරාවේ ගොඩක් දෙනෙක් ඒ රස්සාව කොරේ නැහැ. වෙන වෙන රස්සා තමයි කළේ."

"ඒ වුණාට පරම්පරාවෙන් එන රස්සාව තමයි කරන්න ඕන. එතකොට තමයි හැමෝටම තමතමන්ට සුදුසු තැන හිමිවෙන්නේ. අපේ බස්නායක පරම්පරාවේ සේරම උගත්, බුද්ධිමත් උදවිය. හැමෝම දිසාපති මහත්තුරු. එතකොට චන්ද්‍රරත්න පරම්පරාවට වලව්වක් හෙම තිබුණද?"

“වලව්වක් නම් තිබුණේ නැහැ නෝනා, අපිට ඉන්න හිටින්න ඇති වෙන්න ගෙයක් තිබුණා.”

“ඒක තමයි, මම උපන්තේකෙට අහලා නැහැ චන්ද්‍රරත්න කියලා වලව්කාරයෝ ගැන. මිනිස්සු උන්ට ලැබෙන්න ඕන දේට වඩා ලැබුණාම ලොකුකම් පෙන්නනවා.” ඇය චන්ද්‍රරත්න මහතාට ඇණුම් පදයක් එල්ලකර එතැනින් පිටව ගියේ සිය පරම්පරාවේ තේජස සිහිකරමිනි.
ඇගේ ඇණුම් පදයෙන් චන්ද්‍රරත්න මහතාගේ සිත පෑරුණු මුත් කිසිවක් නොකියා සිටීමට වගබලා ගත්තේය. අපහසුවෙන් මුත් ප්‍රසන්නව සිටීමට වෙර දරමින් බඩුබාහිරාදිය අස්පස් කිරීමේ කටයුතු වලට හැකි අයුරින් උපකාරී වී සවස් වන්නට මත්තෙන් චන්ද්‍රරත්න මහතාත්, ප්‍රේමලතාත් කුලියට ලබා දුන් නිවසින් පිටවී බූවැලිකඩ පිහිටි ඔවුන්ගේ කුඩා නිවස වෙත ගියහ.

අත් උදව්කරුවන් පිරිස ඇඳිරි වැටීමට ඇරඹෙන විටම පිටව ගියහෙයින් ඉතිරිය සැකසීමට පසුදිනට කල් තබා නව නිවැසියන් වේලාසනින් නින්දට ගියහ. එදින දවස පුරාම මුදුව ඩැහැ ගැනීමට අවස්ථාවක් එළැඹෙන තෙක් බලා සිටියද වේළු ඊට අපොහොසත් විය.

ගර්ටි මැතිණියට මෙම නව කුලී නිවසෙහි ගෙවන ජීවිතය එතරම් ප්‍රියමනාප නොවීය. මන්ද යත්, ඇයට මැණික් මුදුව වෙනදාටත් වඩා ආරක්ෂා කිරීමේ භාරදූර කාර්යය පැවරී තිබීම නිසාත් ඔවුන්ගේ නව අසල්වැසියන් එතරම් සාමකාමී පිරිසක් නොවූ නිසාත්ය. මැණික් මුදුවට අමතරව ඇය බියෙන් පසුවූයේ තම සුවිසල් වලව්වට කිසියම් ආකාරයකින් අනතුරක් සිදුවේයැයි කියාය. ඇය නිරතුරුවම සිය වස්තුව පිළිබඳව බිය වූවාය. කෙටියෙන්ම කියතොත් නව කුලී නිවසට පැමිණි දා පටන් ඇය කල් ගෙවූයේ බියෙනි.

ගර්ටි මැතිණියගේ තත්වය එසේ වුවද ඇගේ මුණුපුරාත්, මිණිපිරියත් නව කුලී නිවසේ සිට පාසලට යාමට පහසු වීම නිසා සතුටු වූහ. වෙනදා මෙන් හිමිදිරියේම අවදිවන්නට සිදු නොවන බැවින් විශාකා ද සතුටු වූවාය. බස්නායක මහතා කොළඹ දිසාපති කාර්යාලයේ සේවයට ගොස් සති අන්තයේදී පමණක් නිවසට පැමිණෙන්නේය. නිවසේ වැඩකාරිය වන මහළු ඇසිලින්ද තම දෛනික වැඩකටයුතුවල පුරුදු පරිදිම යෙදුණාය.

එහෙත් වේළු කුලී නිවසට පැමිණි දා සිට මැණික් මුදුව තබා ඇති ස්ථානය සෙයාගැනීමට නොහැකි වූයෙන් කනස්සලයට පත්ව සිටියේය. ඔහු ගර්ටි මැතිණියගේ කාමරයට ගොස් එය තිබේදැයි සොයාබැලීමට නොහැකි බැවින් දුකින් පසුවූයේය. එය වැඩි ආරක්ෂාව සඳහා මුදුව බස්නායක වලව්වේම තබා ආවේදැයි ඔහුට විටෙක සිතුණි.

# 9

එසේ වුවද ඔහු නොසිතූ දිනයක ඔහුට වාසනාව පහළ විය. එදින සතියේ මැද පොහොය දිනයකි. සති අන්තය නොවන බැවින් බස්නායක මහතාද නිවසට පැමිණ සිටියේ නැත. එදින පාසල් නිවාඩු දිනයක් වූයෙන් සමන්ති සහ ජගත්ද නිවසේ සිටියහ. ගර්ටි මැතිණිය වෙනදා මෙන්ම හාන්සි පුටුවට වී සිය වටිනාම වස්තූන් වන මැණික් මුදුවත්, බස්නායක වලව්වත් පිළිබඳව කල්පනා කරමින් හුන්නාය.

ඇයට මිදුලේ දුවමින් සෙල්ලම් කරමින් සිටි සිය මුණුපුරාත් මිණිපිරියත් දුටු විට මෙසේ සිතුණි.

"දරු පැටව් දෙන්නත් දැන් ඒතරම් පුංචි නැහැ. උන්ටත් යමක් කමක් තේරෙනවානේ. දැන්මම පොඩි උන් දෙන්නට බස්නායක පරම්පරාව ගැන කියලා දෙන්න ඕන. මුද්දත් පෙන්නන එක හොඳයි. කවදාහරි මේ දේවල් සේරගෙම අයිතිකාරයෝ වෙන්නෙත්, ඒවා ආරස්සා කරන්න ඕනත් එයාලමනේ."

ගර්ටි මැතිණිය සමන්තිට සහ ජගත්ට තමා අසළට පැමිණෙන ලෙසට අඬගැසුවාය. ඔවුන්වද කැටුව ඇය සිය කාමරය වෙත ගියාය.

“මම අද පුතාලට අපේ පරම්පරාව ගැන කියලා දෙන්නයි යන්නේ.” ඇය ඔවුන්ට පැවසුවාය. දරුවන් දෙදෙනා ඇඳ මත හරිබරි ගැසී හිඳගත්තේ කතාව ඇසීමටය.

“අපේ පරම්පරාව තමයි බස්නායක පරම්පරාව. පුතාලා මම කියන දේවල් හොඳට හිතටගන්න ඕන. බස්නායක පරම්පරාව දැනට අවුරුදු එකසිය පනහකට විතර කලින් ඉඳලාම පැවතගෙන ආව එකක්. හැමෝම හොඳ උගත් අය. අපිට අපේ පරම්පරාවේ කලින් හිටිය උදවියගෙන් ලැබුණු දේවල් ගොඩක් තියනවා. වටිනම දේවල් තමයි වලව්වයි, මැණික් මුද්දයි.”

“මැණික් මුද්ද? ඒ මොකක්ද අත්තම්මේ?”

“ඉන්නකො මම මුද්ද පෙන්නන්න.” කියමින් ඇය අල්මාරයේ තිබූ යකඩ සේප්පුව ඇර මැණික් මුදුව සහිත රත්රන් මංජුසාව පිටතට ගත්තාය.

එවේලෙහිම වේළු තේ බන්දේසියක්ද රැගෙන පැමිණියේ ගර්ටි මැතිණිය ඊට සුළු වේලාවකට පෙර තේ ගෙනඑන ලෙස අණ කළ බැවිනි. ඇය සාලයෙහි නොවූයෙන් වේළු තේ බන්දේසිය ඇයගේ කාමරයට ගෙනයාමට සිතා එදෙසට ගියේය. කාමරයට ලංවෙත්ම ඔහුට ඇතුල සිටින්නවුන් මැණික් මුදුව ගැන කතාබහෙහි යෙදෙණු

ඇසුණි. ඔහුගේ සිත සතුටින් ඉපිලෙන්නට විය. කතාබහට රහසේම සවන් දියයුතු හෙයින් ඔහු දොර අසළ නැවතී අසා සිටියේය.

"අත්තම්මේ, ඔය මොකක්ද?" ගර්ට් මැතිණියගේ අතෙහි ඇති මැණික් මුදුව දුටු දරු දෙදෙනා ඇසූහ.

"මේක තමයි මම කියාපු මැණික් මුද්ද. මට මේක ලැබුණේ මගේ කිරි අත්තම්මගෙන්. මගෙන් පස්සේ මේකේ අයිතිකාරයෝ ඔයාලා තමයි. මේක ඇහැක් වගේ ආරස්සා කරන්නත් ඕන."

"ඒක හරිම ලස්සනයි අත්තම්මේ. ඔය උඩින් තියෙන්නේ මැණික් ගල්ද?"

"ඔව්, මෙතන බොහොම වටින වර්ග නවයක මැණික් ගල් නවයක් තියනවා."

"ඕක කොච්චරක් විතර වටිනවද අත්තම්මේ?"

"ම්... මම හිතන්නේ රුපියල් ලක්ෂ තුන හතරක් විතර වටිනවා ඇති."

"ලක්ෂ තුන හතරක්? එච්චර වටිනවද?"

“ඔව්, මට ඇහිලා තියනවා මගේ පප්පා කියනවා මේ මුද්ද ගන්න ඒ කාලේ වලව්කාරයෝ ඉල්ලන ඕන දෙයක් දෙන්නම් කිව්වලු. මේක ඒ දවස්වල රන් පවුම් හාරදාහක් විතර වටින මුද්දක්ලු. සිංහල රජවරු ළඟ තිබුණ නවරත්න මුදුවලටත් වඩා මේක බොහොම වටිනවා. මොකද මෙතන තියෙන මැණික් ගල් නවයෙන් හතරක්ම ලංකාවේ හොයාගන්නවත් බැරි ගල් වර්ගලු.” ඇය මුදුවේ මැද අල්ලා තිබුණු ප්‍රමාණයෙන් විශාල මැණික් ගල් හතරක් පෙන්වමින් කීවාය. “පුතාලා මේක හැමදාටම ආරක්ෂා කරනවා නේද?”

“ඔව්, අත්තම්මේ.”

“හොඳ දරුවෝ. දැන් ගිහින් පාඩම් වැඩක් කරන්න.” කියමින් ඇය දරුවන් දෙදෙනාව පිටත් කර හැරියේය.
මුදුව ගැන ඇතිවුණු කතාබහට රහසේ කන්දුන් වේළු තේ බන්දේසියද රැගෙන ගර්ටි මැතිණියගේ කාමරය තුළට ගියේය. ඔහු එහි ඇතුළුවත්ම ගර්ටි මැතිණිය ඔහුට මහ හඬින් බැණ වදින්නට විය.

“මම තේක ගේන්න කිව්වේ කොයි වෙලාවෙද? දැන්ද උඹ තේක අරන් එන්නේ? ඕක ඔතනින් තියලා පලයන්.”

වේළු කිසිත් නොකියා තේ බන්දේසිය මේසය මත තබා හිස නවාගෙන කාමරයෙන් පිටතට පැමිණියේ සිත යටින් සතුටු වෙමිනි. ඔහු පිටව ගියායැයි සිතූ ගර්ටි මැතිණිය මුදුව සහිත මංජුසාව නැවත සේප්පුවට දා යතුරු ලැවාය. ඉන්පසු එම යතුර අල්මාරිය උඩ තිබුණු කුඩා පෙට්ටියකට දමා වැසුවාය.

මේ සියල්ල වේළු කාමරයෙන් පිටතට වී දොර හිලෙන් බලා හුන්නේය. යකඩ සේප්පුවේ යතුර තබන ස්ථානය දැනගත් බැවින් ඔහුගේ සතුට නිම්හිම් නැතිවිය. නොබෝ දිනකින්ම මැණික් මුදුව තමාගේ අතට පැමිණෙන බව ඔහු තරයේ විශ්වාස කළේය. ඒ සඳහා අවශ්‍යව තිබුණේ ගර්ටි මැතිණිය නිවසේ නොමැති විනාඩි කිහිපයක් පමණි. නමුත් වේළු සිතුවාටත් වඩා ඉක්මනින් එවන් වාසනාවන්ත දිනයක්ද උදාවිය.

දිනපතා සිය සුවිසල් වලව්ව ගැනම සිතසිතා සිටි ගර්ටි මැතිණියට දිනක් හදිසියේම වලව්වේ වැඩ කටයුතු සොයා බැලීමට එහි යාමට සිත්විය. එදින සති අන්තයක් වූයෙන් බස්නායක මහතාද නිවසට පැමිණ සිටි බැවින් එදින ඊට සුදුසු දවසක් විය. සිය මවගේ කනස්සලු ස්වභාවය දුටු බස්නායක මහතා එදිනම ගර්ටි මැතිණියත්, විශාකාත්, දරුවන් දෙදෙනාත් සමඟ මාතලේ බලා පිටත්ව ගියේය.

# 10

නොසිතූ විරූ ලෙස පහල වුණු මෙම වාසනාව පිළිබඳව වේළු බොහෝ සෙයින් සතුටට පත්වූයේය. ඔහු ගර්ටි මැතිණිය පිටත්ව ගිය වේලෙහි පටන් මුදුව සොරකම් කරන්නේ කෙසේදැයි කල්පනා කරන්නට විය. නිවසේ වැඩ කටයුතු හමාර කරන ඇසිලින් දහවලේ දී කෙටි නින්දක් ලබා ගන්නා බව වේළු දනී. එම පැය කිහිපයක කාලය මුදුව සොරකම් කිරීමට උචිතම කාලය බව සිතූ ඔහු දහවල උදාවන තෙක් නොඉවසිල්ලෙන් පසුවූවේය. කාලය ගෙවී ගොස් දහවල් කාලය එළැඹිණි. සුපුරුදු පරිදි උදය වරුවේ රාජකාරී හමාර කළ ඇසිලින් කෙටි නින්දකට අවතීර්ණ වූවාය.

වේළු හඬ නොනඟා රහසේම ගර්ටි මැතිණියගේ නිදන කාමරයට වැදුණේය. ඔහු එදින රහසේ බලා සිටියදී ගර්ටි මැතිණිය සේප්පුවේ යතුර දැමූ පෙට්ටියෙන් යතුර පිටතට ගත්තේ වෙව්ලන දෑතිනි. ඔහුගේ සර්වාංගයම වෙව්ලමින් තිබුණි. උපතේ පටන්ම කෙතරම් අඟහිඟකම්වලට මුහුණ දී තිබුණද ඔහුට කෙදිනකවත් අන් අයකුගේ යමක් සොරකම් කිරීමට උවමනා නොවීය. ඔහු සොරකම් කිරීමට බිය වූවේය. නමුත් ඔහුට මැණික් මුදුව ගැනීමට තිබුණු දැඩි ආශාව ඔහුව සොරකම් කිරීමට පෙළඹවීය.

ඔහු වෙව්ලන දෑතින් සේප්පුව ඇර එහි වූ රත්රන් පැහැ මංජුසාව දෑතට ගත් විගස ඔහුගේ කොඳු නාරටිය සීතල වී ගියේ නොදැනුවත්වමය. ඔහු එහි පියන සෙමෙන් විවෘත කළේය. විශාල මැණික් මුදුව මංජුසාව තුලින් මතුවූයේ ඔහුගේ දෑස් නිලංකාර කරවමිනි. ඔහු මුදුව සහිත මංජුසාව මේසය මත තබා එයට දොහොත් මුදුන් දී කිහිප වරක් වැඳ මැණික් මුදුව අතට ගත්තේය.

මුදුවේ බර දෑතට දැනෙන්නට ගත් විගස ඔහුගේ දෑසින් කඳුළු කැට කඩා හැලෙන්නට වූයේ තමා සිදුකරමින් සිටින පාපී ක්‍රියාවේ ආදීනව කෙලෙස වේදැයි සිතුණු බැවිනි. හිස් වුණු රත්රන් මංජුසාව නැවත සේප්පුව තුලට දමා යතුරැලූ ඔහු යතුර නැවත එය තිබුණු පෙට්ටියට දැමූවේය. අවසන දිගු සුසුමක් හෙළූ ඔහු සියල්ල පෙර පරිදිම පවතින්නේදැයි බලා ඉක්මනින් කාමරයෙන් පිටව ගියේය. ඔහු මහත් භක්තියෙන් මුදුව දෑතින් ගෙන සිය පැදුර අසළට ගොස් එය සැඟවීමට සුදුසු ස්ථානයක් ගැන සිතුවේය.

"මුද්ද නැතිබව දැනගත්තම ලොකු මැණිකේ හැමතැනකම හොයාවි. අපේ රෙදිපෙරෙදිත් ඇදලා බලාවි. ඒක නිසා මේක මං ළඟ තියාගන්න එක ඇඟට ගුණ නැහැ. මම මේක කුස්සියේ හංඟනවා. එතකොට ඕන වෙලාවක ගන්න පුළුවන්නේ." ඔහු තමාටම කියාගත්තේය.

ඔහු මුද්දත් රැගෙන මුළුතැන්ගෙට ගොස් කිසිවෙකුට සොයාගත නොහැකි පරිදි එය සැඟවීමට තැනක් සෙව්වේය. හාල් ගෝනි, තුනපහ දමන බඳුන්, එළවළු රාක්ක ආදී මුළුතැන්ගෙයිහි සෑම තැනකම පාහේ ඔහු මුද්ද සඟවා බැලුවද ඒ එක් ස්ථානයක්වත් එතරම් ආරක්ෂිත නොවීය. අවසානයේ ඔහු මුදුව සැඟවීමට ස්ථානයක් සොයාගත්තේය. ඒ මුළුතැන්ගෙයි පිඟන් සෝදන බේසම යට ජලය බැස යාමට සවිකරන ලද බටය කෙළවරය. එය කිසිවකුත් යමක් සඟවා ඇතැයි නොසිතන ස්ථානයක් වන බැවින් කිසිවකුට මුද්ද සොයාගත නොහැකි වේයැයි ඔහු සිතුවේය.

වලව්වේ වැඩ කටයුතු බැලීමට මාතලේ බලා ගිය පිරිස එදින රාත්‍රියේම නැවත පැමිණියහ. නමුත් ගර්ට් මැතිණියට එදින තම මැණික් මුදුව බැලීමට උවමනාවක් නොවූයේ සිය වලව්ව දැක ගැනීම නිසා ඇගේ සිත පිරී තිබුණු බැවිනි. දින, සති, මාස ගෙවී ගියේය. දිනක් හදිසියේම ගර්ට් මැතිණිය යකඩ සේප්පුව ඇර මුදුව බහාලන රත්රන් මංජුසාව පිටතට ගත්තාය. පෙට්ටියේ පියන ඇරි ඇ මහ හඬින් ලතෝනියක් තබමින් පෙට්ටිය බිම අතඇරියාය. ඇය විලාප තබමින් හඬා වැටෙන්නට විය. මේ ගාලගෝට්ටිය ඇසුණු විශාකාත්, ඇසිලින් සහ වේළුත් එතැනට දිව ආහ. විශාකා මෙන්ම ඇසිලින්ද ශාප කරමින් හඬා වැලපෙන ගර්ට් මැතිණියවත්, බිම වැටී පළුදු වුණු රත්රන්

මංජුසාවත් දැක විස්මයට පත්වුවද සිදුවී ඇති දෙය වහා වටහාගත් වේළු පසුපසට වී බිම බලාගත්වනම සිටියේය. හඬා වැලපෙමින් සිටි ගර්ටි මැතිණිය ක්ලාන්ත වූයෙන් විශාකා සහ ඇසිලින් ඇයට සාත්තු කරන්නට වූහ.

ඇය නැවත ප්‍රකෘති තත්වයට පත්වූ පසු ඔවුන්ට කෙසේ, කොතැනකින් හෝ මැණික් මුදුව සොයා ගෙන එන ලෙසට අණ ලැබුණි. ඇගේ අණ පැහැර හැරිය නොහැකි බැවින් වේළු මුළුතැන්ගෙයි හැර අනෙක් සෑම අස්සක් මුල්ලක් නෑරම මුදුව සොයන අන්දමින් හැසිරුණේ තමා පිළිබඳව කිසිදු සැකයක් කිසිවකු තුල ඇති නොකරවීමටයි. තමා මුදුව සැඟවූ ස්ථානයෙන් කිසිවෙක් එය සොයාගනීදැයි ඔහුගේ සිත දෙගිඩියාවෙන් පසුවිය. එහෙයින් ඔහු නිතර මූළුතැන්ගෙයට එබී බැලුවේ තම සැකය දුරු කර ගැනීම සඳහාය.

සවස සමන්ති සහ ජගත් පාසල නිම වී නිවසට පැමිණි විට ඔවුන් ගෙනුත්, නිවසේ මෙහෙකරුවන් ගෙනුත් මුදුව ගත්තේදැයි විමසන ලදී. අවසානයේ වේළුගෙන් ප්‍රශ්න කිරීමේ අවස්ථාවද පැමිනුණි. ඔහුගේ හෘද ස්පන්දන වේගය දරුණු ලෙස ඉහළ ගොස් තිබුණි. දෙකකුල් අප්‍රාණිකව යන සෙයක් ද දැනෙන්නට විය. ඔහුට ක්ලාන්ත

ගතියක් දැනුණි. ඔහු පැකිලෙමින් ගර්ටි මැතිණිය අභියසට ගියේය. ගර්ටි මැතිණිය රකුසු වේශයෙන් හාන්සි පුටුව මත හිඳ සිටින්නීය.
“උඹ එහෙම දැක්කද මගේ මැණික් මුද්ද?” ගර්ටි මැතිණියගේ සැරපරුෂ හඬින් වෙළු ගැස්සුණි. ශීත කාලයකදී මෙන් ඔහුගේ ඇඟේ හිරිගඩු පිපෙන්නට විය.

“න්...නැ..හැ...ලො...කු මැණිකේ, ම...මම ඔය කියන මුද්...ද දැක්...කෙ නැහැ.”

“මොකෝ උඹ ගොත ගහන්නේ?” ගර්ටි මැතිණිය කඩා පැන්නාය.

“මොක්..කුත් නැහැ ලොකු මැණිකේ.”

“එතකොට උඹ කියන්නෙ උඹත් මුද්ද දැක්කේ නැහැ කියලා?” ඇගේ දෑස් කෝපයෙන් දිලිසුණි.
“ඔව්,ඔව්, ලොකු මැණිකේ.”

“හ්ම්, දැන් පලයන්. ගිහින් මුද්ද හොයපන්.” කියමින් ඇය වෙළුව පන්නා දැමුවාය. ඔහුගේ කයට යන්තමින් හෝ ප්‍රාණයක් ලැබුණේ එවිටය. නමුත් ඔහුගේ සිත තුල වූ බිය පහව ගියේ නැත.

ගර්ට් මැතිණිය එදිනම බස්නායක මහතාට නැතිවුණු මුදුව ගැන පැවසීමට ඇමතුමක් ලබාගත්තාය. පසුදිනම බස්නායක මහතා කුලී නිවසට පැමිණියේය. ඔහුත් නිවසේ යාහැකි සියලු තැන්වලත්, මෙහෙකරුවන්ගේ රෙදි පොදි, කොට්ට පැදුරු තුල පවා සොයාබැලුවේය. නමුත්, මුළුතැන්ගෙයි සෝදන බේසම පිටුපස එය ඇතැයි ඔහුට නොසිතුණි. එහෙයින් ඔහුටද මුදුව සොයා ගැනීමට නොහැකි විය. ඉන් කෝපයට පත්වූ ඔහු ඇසිලින් සහ වේළු මුදුව සොරකම් කළේ යැයි සිතා ඔවුන්ව කැඳවා බැණ වැදුණේය.
"උඹලාව මම රස්සාවට ගත්තේ උඹලා ගැන විශ්වාස කරලා."

"අනේ මහත්තයෝ, අපි ඔය කියන මුද්ද දැකලාවත් නැහැ." ඇසිලින් බයාදු ලෙස පැවසුවාය.

"එහෙනම් කවුද ඒක හොරකම් කළේ? මේ ගෙදරම ඉන්න එකෙක් නොවෙන්න?" ඔහු කඩාපැන්නේය.

"අනේ අපි දන්නේ නැහැ මහත්තයෝ." ඇසිලින් එසේ පවසද්දී වේළුට තමා එය සොරකම් කළේ යැයි පවසා ප්‍රශ්ණය එතෙකින් කෙළවර කරන්නට සිතුණද ඔහු කිසිත් නොකියා බිමබලාගෙන සිටියේය.

"එහෙනම් පිටින් හොරෙක් ඇවිත් මුද්ද හොරකම් කරගෙන යනකම් උඹලා මොනවද කළේ?" ඔහු නැවත වරක් කඩා පැන්නද එවර ඇසිලින්වත්, වේළුවත් පිළිතුරු දුන්නේ නැත. ඉන් සිදුවූයේ බස්නායක මහතාගේ කෝපය තවතවත් වර්ධනය වීමයි.

"උඹලා වගේ හොරුන්ව තවදුරටත් වැඩට තියාගන්න මට ඕන නැහැ. මේ දැන්ම උඹලාගේ තියන දෙයක් අරගෙන මෙහෙන් තොලොංචි වෙනවා." ඔහු එසේ කියමින් කේන්තියෙන් පිටව ගියේය. ඇසිලින් කෙතරම් බැගෑපත් වුවද ඔහු ඒවා කනකට හෝ නොගත්තේය. නමුත් මෙවැනි දෙයක් බලාපොරොත්තු වූ වේළු බැගෑපත්වන්නට නොගොස් තම රෙදි පොට්ටනිය සූදානම් කරගෙන මුළුතැන්ගෙයට ගියේ මුදුව සැඟවූ ස්ථානයෙන් ගැනීමටය. නමුත් අවාසනාවකි!! ඔහු එහි යන විට බස්නායක මහතා එතැනය.
"ආ..උඹ යන්න ලෑස්ති වුණාද?" ඔහු රවා බලමින් පැවසුවේය. ඊට පිළිතුරු නොදී වේළු හිස පහත් කරගෙන මුළුතැන්ගෙයි දොරින් පිටතට පැමිණියේය.
ඔහුට යන්නට තැනක් නොවීය. අවසානයේ මුද්ද සැඟවූ තැනින් රැගෙන එන්නට නොහැකි වීම කරගත් සොරකමද අපතේ ගියාක් මෙන් විය. මේ කිසිවක් නොදන්නා ඇසිලින්ටද ඇගේ රැකියාව අහිමි වීම ගැන ඔහු දුක්වුණේය. තමා කළ පාපය මෙලෙස පටිසන් දුන්නේයැයි සිතූ ඔහු මුදුව සොරකම් කිරීම ගැන පසුතැවුණේය.

නමුත් තමා එය සොරකම් කළේ යැයි පැවසීමට තරම් ශක්තියක් ඔහු තුල නොතිබුණි.

බස්නායක මහතා, සේවකයන් රැකියාවෙන් පහ කිරීමෙන් පමණක් නොනැවතුණි. සිය මවට හොරෙන් මැණික් මුදුව සොරකම් කළේ යැයි පවසමින් ඔහු කුලී නිවසේ අයිතිකරු වූ චන්ද්‍රරත්න මහතා සමඟද අමනාප විය. අසා දැක නැති මුද්දකට චෝදනා ලැබීමෙන් චන්ද්‍රරත්න මහතා, බස්නායක පවුල පිළිබඳව නොහොඳ සිතක් ඇතිකරගත්තේය. මින් දින කිහිපයකට පසු බස්නායක පවුලේ උදවිය කුලී නිවසේ පදිංචිය අතහැර දමා නැවතත් මාතලේ වූ සිය වලව්වට ගියහ.

මේ අතර ගර්ට් මැතිණිය දැඩි ශෝකය හේතුවෙන් නිතරම අසනීප වූවාය. ඇය විටෙක කිසිවක් නොකා නොබී බලාගත්වනම බලා සිටියාය. නිසි පරිදි සේවයට වාර්තා නොකිරීම හේතු කොටගෙන කොළඹ දිසාපති කාර්යාලය විසින් බස්නායක මහතාව දිසාපති ධූරයෙන් පහ කරන ලදී. නමුත් තවත් වසර කිහිපයක් කරදරයකින් තොරව ජීවත් වීමට තරම් මුදලක් ඔහු ඉතිරි කර තිබුණි.

# 11

තම නිවස කුලියට ගත් මෙම වංශවත්, කුලවත් ගැණුම්කරුවාගෙන් හදිසියේ තමා වෙත එල්ල වූ අද්භූත චෝදනාව ගැන චන්ද්‍රරත්න මහතා විස්මයට පත්ව සිටියේය. එහෙයින් ඉක්මනින්ම ඔවුන් නිවසෙන් පිටකර ගැනීමට හැකිවීම පිළිබඳව ඔහු සතුටු විය. ඒ අතරතුර නව ගැණුම්කරුවකුට නිවස ලබා දීමට පෙර, එහි පවතින මුළුතැන්ගෙය වෙනුවට නව අංග වලින් යුත් නව මුළුතැන්ගෙයක් සෑදීමට ඔහුට සිත්විය. ඉදිකිරීම් කටයුතු වලට පමණක් කම්කරුවන් ගෙන්වීමට සිතූ ඔහු තනිවම මුළුතැන්ගෙයි නව අංග සවිකළ යුතු තැන් කඩාදැමීමට පියවර ගත්තේය. ඔහු පිඟන් සෝදන බේසමත්, ඊට සම්බන්ධ කොන්ක්‍රීට් ලෑල්ලත් කඩ දැමීමට පටන් ගත්තේය. ඔහු එහි බේසම යට ඇති බටය ගලවා ගන්නා විට බරැති යමක් බිම වැටෙන හඬක් ඇසුණි.

පුදුමයකි! ඔහුට සිය දෑස් අදහාගත නොහැකි විය!! බිම වැටී ඇත්තේ විශාල මැණික් ගල් නවයක් ඔබ්බවා ඇති රනින් කළ මුද්දකි!!! එවන් අලංකාර මැණික් මුදුවක් ඔහු කෙදිනකවත් දැක තිබුණේ නැත. වෙව්ලන දෑතින් මුදුව අතට ගත් ඔහුට ඉබේම කෑගැසුණි. ඔහුගේ කෑගැසීම ඇසුණු ප්‍රේමලතා එතැනට දිව ආවාය. ඈ ඔහු අත වූ අනර්ඝ මැණික් මුදුව දෙස අයාගත් මුවින් බලා සිටියහ.

චන්ද්‍රරත්න මහතාත්, ඔහුගේ බිරිඳ ප්‍රේමලතාත් හදිසියේ මතුවූ මේ මුදුව ගැන සාකච්ඡා කරන්නට වූහ.

"මේක නම් දෙයියෝ දුන්න එකක් වගේ." ප්‍රේමලතා මුදුව අතෙහි තබාගෙන පැවසුවාය.

"මම නම් හිතන්නේ ඕක අර ගේ කුලියට ගත්ත දිසාපති මහත්තයාගේ කියලයි. මේකට වෙන්න ඇති එදා මට බනින්න ඇත්තේ. "

"මෙච්චර වටින මුද්දක්?"

"ඔව්, ඒ මහත්තයාලා හොඳ වලව්කාරයොනේ. මාතලේ තියෙන අර බස්නායක වලව්වෙ තමයි ඉන්නේ, දැක්කෙ නැද්ද එදා ඒ ළමාතැනීගේ මාන්නෙ?"

"බස්නායක වලව්ව? අර මහපාරට පේන මහා බංගසාල වලව්ව? අප්පේ, එහෙනම් මේකත් පරම්පරාවෙන් ලැබුණු එකක් වෙන්ටැති."

"වෙන්ටැති, ඔය වගේ එකක් සාමාන්‍ය මිනිස්සු ළඟ තියෙනවායැ?"

"එතකොට කොහොමද මේක කුස්සියේ බේසම පිටිපස්සට ගියේ?"

“ඒක තමයි මටත් හිතාගන්න බැරි.”

“ඒත් අපි මේක නොදී තියාගමමු. දිසාපති මහත්තයා දන්නේ නැහැනේ ඒක මෙහෙ කියලා.” ප්‍රේමලතා කළ ඒ යෝජනාවට චන්ද්‍රරත්න මහතා එක පයින් සිය කැමැත්ත ප්‍රකාශ කළේ මෙම මැණික් මුදුවේ වටිනාකම එසේ මෙසේ ගණනක් නොවන බව මැනෙවින් පසක් කර ගත් බැවිනි. එහෙයින් ඔවුහු මුදුව බැංකුවක සේප්පුවක් තුල තැම්පත් කළේ ඊට ආරක්ෂාව සැලසීම සඳහාය.

…෴෴෴…

වැඩි කලක් නොගියේය. ප්‍රේමලතා මහත්මිය හදිසියේ අසනීප වූවාය. චන්ද්‍රරත්න මහතාගේ සේවා ස්ථානයේද විවිධ ගැටලු පැනනැඟෙන්නට විය. ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලටද බාධා ඇතිවිය. ගඟක් ගලා එන්නා සේ නොයෙක් ප්‍රශ්ණ එකක් පසුපස එකක් නොනවත්වා පැමිණෙන්නට විය.

“මට නම් හිතෙන්නේ මේ සේරම ප්‍රශ්ණ එන්නේ අර මුද්ද නිසා කියලයි.” තවදුරටත් පිටපිට එන ප්‍රශ්ණ වලට මුහුණ දීමට තරම් ශක්තියක් නොවූ චන්ද්‍රරත්න මහතා පැවසුවේය.

“ඔව්, මටත් දැන්නම් එහෙම හිතෙනවා. මුද්ද තියාගත්තට පස්සේ තමයි මේ හැමදේම.” ප්‍රේමලතාද ඊට එකඟ වෙමින් පවසුවාය.

“අපි ඔය මුද්ද ආපහු දෙමු. නැත්තම් අපිට කවදාවත් සැනසිල්ලේ ඉන්න ලැබෙන්නේ නැතිවෙයි.” චන්ද්‍රරත්න මහතාගේ කියමනට ප්‍රේමලතා සිය කැමැත්ත ප්‍රකාශ කළේ මඳවේලාවක් නිහඬව සිටීමෙන් පසුවය.

“අනුන්ගේ දේවල් හොරෙන් ගත්ත එකේ එලවිපාක තමයි අපි අද මේ විඳවන්නේ. ඔයා දිසාපති මහත්තයාට කතාකරලා මුද්ද ගෙදර තිබිලා හම්බවුණා කියලා කියන්න.”

“ඔව්, ඒක අපි තියාගත්තා කියලා කියන්න නරකයි. මම හෙටම ගිහින් බැංකුවෙන් මුද්ද අරගෙන එනවා.”

පසුදින උදෑසනම චන්ද්‍රරත්න මහතා බැංකුවට ගොස් මැණික් මුදුව රැගෙන පැමිණ බස්නායක වලව්වට ඇමතුමක් ලබාගත්තේය.

“මේ බස්නායක වලව්වෙන්ද? මම චන්ද්‍රරත්න කතාකරන්නේ.” ඔහු පැවසුවේය.

දුරකථනයේ අනෙක් පසින් දිසාපති මහතාගේ කටහඬ ඇසුණි. "ඔව්, කියන්න චන්ද්‍රරත්න."
"දිසාපති මහත්තයාගේ වටිනා මුද්ද ලේවැල්ලේ ඉන්දැද්දී නැතිවුණා කියුවා නේද?" ඔහු බොහොම යටහත් පහත් ලෙස විමසුවේය.
"ඔව්, ඇයි ඒ ගැන අහන්නේ?"

"නැහැ දිසාපති මහත්තයෝ, අපි ගෙදර අලුත්වැඩියා කටයුතු වගයක් කරද්දී අපිට ඒක හම්බවුණා."
බස්නායක මහතාගේ සිත දෝලනය වන්නට විය. ඔහු සිහින් කටහඬකිනි "හම්බවුණා කියුවේ?" යැයි ඇසුවේය.

"ඔව්,ලොකු මැණික් ගල් ඔබ්බවපු මුද්දක්...කුස්සිය කඩනකොටයි මට හම්බවුණේ."

සතුට ඉහවහා ගිය හෙයින් බස්නායක මහතාට ඉබේම කෑගැසෙන්නට ගියේය. "ඔය මුද්ද අපේ පරම්පරාවෙන් ලැබුණු බොහොම වටිනා දෙයක්. මුද්ද නැතිවුණ දවසේ ඉඳලා අම්මා ලෙඩ ඇඳට වැටිලයි ඉන්නේ. දැන් චන්ද්‍රරත්න මහත්තයා ඒකට මොකද කළේ?"

“මුද්ද මා ගාව තියනවා දිසාපති මහත්තයෝ. දිසාපති මහත්තයාට පුළුවන් නම් ඒක ගන්....” ඔහු එය පවසා අවසන් වීමටත් පෙර බස්නායක මහතා ඊට පිලිතුරු දුන්නේය.

“හරි, හරි, මම ඒක ගන්න මේ දැන්ම එන්නම්. චන්ද්‍රරත්න මහත්තයාලා හරිම ගුණ යහපත් උදවිය. ඔයතරම් වටිනා දෙයක් ලැබිලත් ඒක තියාගන්නේ නැතිව ඒක බාරදෙන්න තරම් නිර්ලෝභී අය. බොහොම පින් මේ කළ උපකාරෙට. මට චන්ද්‍රරත්න මහත්තයාට ස්තූති කරන්න වචනත් නැහැ.” බස්නායක මහතා එසේ පවසද්දී චන්ද්‍රරත්න මහතාට තමා ළඟ මුද්ද තබාගෙන සිටීම පිළිබඳව වරදකාරී හැඟීමක් ඇතිවිය.

බස්නායක මහතා ඇමතුම අවසන් වූ විගස සතුටින් ගර්ටි මැතිණියගේ කුටිය වෙත දිව ගියේය. ඇය බෙහෙවින්ම අසාධ්‍යව ඇඳ මත වැතිර සිටියාය. ඔහු ගර්ටි මැතිණිය අසලට ගොස් තමාට මොහොතකට පෙර අසන්නට ලැබුණු සුභ පණිවුඩය පැවසුවේය. එය ශ්‍රවණය වත්ම ගර්ටි මැතිණියගේ දෑසින් කඳුළු කඩා හැලුණි. හැකි ඉක්මනින් ලේවැල්ලට පැමිණීමට පිටත් වූ බස්නායක මහතාට දහවල වන විට එහි ළඟා වීමට හැකි විය.

## 12

ගිණි ගහන දහවලේ සිය නිවස ඉදිරිපස වේගයෙන් පැමිණි නැවැත්වූ මෝටර් රථයක ශබ්දයෙන් චන්ද්‍රරත්න මහතා නිවසින් පිටතට පැමිණ බැලුවේය. එය බස්නායක මහතාගේ මොරිස් මයිනරය බව ඔහු දුටු විගස ඇඳින්නේය. බස්නායක මහතා කාරයෙන් බිමට පැන වේගයෙන් නිවස දෙසට පැමිණියේ සතුට උතුරා යන මුහුණකිනි. චන්ද්‍රරත්න මහතා ඔහුට මැණික් මුදුව බාරදුන්නේය. ඔහු තේ ටිකක් බීමටවත් නොනැවතී නැවත සිය මෝටර් රථයට නැඟී මාතලේ බලා වේගයෙන් රිය පදවන්නට විය.

“අම්මේ, අම්මේ!! මම මුද්ද ගෙනාවා!!!” ඔහු කෑගසාගෙන වලව්වට ගොඩවිය. ඔහුගේ කටහඬ ඇසුණු වලව්වේ නව සේවිකාව වන සෝමා, ගර්ටි මැතිණියගේ කාමරයේ සිට පිටතට පැමිණියාය. ඇයගේ දෑස් වලින් කඳුළු කැට කඩාහැලෙමින් තිබුණි. ඒ දුටු බස්නායක මහතා වික්ශිප්ත විය.

“මොකද සෝමා මේ?”
සෝමා කිසිත් නොකියා නොනවත්වා හඬන්නට විය. බස්නායක මහතා නැවතත් ඇගෙන් ප්‍රශ්න කළේය.

“අනේ මහත්තයෝ, අපේ ලොකු මැණිකේ අන්තරා වුණා, මහත්තයා පිටත්වෙලා පැය කීපෙකින්.” ඇය මහා හඬින් විලාප දෙමින් පැවසුවාය.

එම වචන කිහිපය කන වැකෙත්ම බස්නායක මහතාට සිය කය අප්‍රාණිකව යන සෙයක් දැණුනි. ‘ලොකු මැණිකේ හදිසියේම අන්තරා වුණා.’ යන වචන පෙල ඔහුගේ සිත තුල කරකැවෙන්නට විය. ඔහු වේගයෙන් ගර්ටි මැතිණියගේ කාමරය වෙත දිව ගියේය. ගර්ටි මැතිණිය ශාන්ත ඉරියව්වෙන් දෑස් වසාගෙන ඇඳේ වැතිර සිටිය මුත් ඒ වන විටත් ඇගේ ප්‍රාණය නිරුද්ධ වී පැයකට ආසන්න කාලයක් ගෙවී තිබුණි. නමුත් ඇගේ වැසුණු දෑස්වලින් ඇගේ සිතේ පැවති දුක, වේදනාව මනාව පෙනෙන්නට විය.  ඇගේ ඇඳ පාමුල විශාකා හඬමින් සිටියාය. බස්නායක මහතා මහ හඬින් “අම්මේ!!” කියා කෑගැසුවේ ඇය නැවත කිසිදාක නොනැඟිටින බව දැන වුවත් සිතෙහි කොනක ඇය නැවත පණ ලබාවි යැයි තිබුණු විශ්වාසය නිසයි.

***ඔහු සිය මවගේ නිසල දේහය දෙස හිස් බැල්මකින් බලා හුන්නේය. එතෙක් වේලා දෑතේ මිට් මොලවාගෙන සිටි මැණික් මුදුව ඔහුගේ දෑතින් ගිලිහී ගියේ ඔහුට නොදැනීමය.***

...නිමි...

තණ්හාව පුහුදුන් මිනිස් සිත් තුල නිරන්තරයෙන් උපදින්නකි. එමෙන්ම තණ්හාවට වහල් වීම, මිනිසාව ලෙහෙසියෙන්ම විනාශය කරා ගෙන යයි. එහෙයින් බුද්ධ වචනයට අනුව මෙම තණ්හාව මුලිනුපුටා දැමිය යුතු වේ.

## *...පසුවදන...*

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍යය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.

ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයන් සහ සැළසුම්කරුවන් මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප

මංකොල්ලයට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20

තම නිවස කුලියට ගත් මෙම වංශවත්, කුලවත් ගැණුම්කරුවාගෙන් හදිසියේ තමා වෙත එල්ල වූ අද්භූත චෝදනාව ගැන චන්ද්‍රරත්න මහතා විස්මයට පත්ව සිටියේය.

***එතෙක් වේලා දැතේ මිටි මොලවාගෙන සිටි මැණික් මුදුව ඔහුගේ දැතින් ගිලිහී ගියේ ඔහුට නොදැනීමය.***

තණ්හාව පුහුදුන් මිනිස් සිත් තුල නිරන්තරයෙන් උපදින්නකි. එමෙන්ම තණ්හාවට වහල් වීම, මිනිසාව ලෙහෙසියෙන්ම විනාශය කරා ගෙන යයි. එහෙයින් බුද්ධ වචනයට අනුව මෙම තණ්හාව මුලිනුපුටා දැමිය යුතු වේ.

නතාරි දම්සිනි විතානාච්චි

මහ/මහාමායා බාලිකා විදුහල